# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/26 - 2020 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තංගල්ල, වගේගොඩ, ඓතිහාසික රන්කොත්මළු පුරාණ රාජමහා විහාරයට අයත් පූජනීය ප්‍රදේශය, පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

අංක 2153/12 හා 2019 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2153/12- 2019 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා ප්‍රසිද්ධ කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා හට පැවරී ඇති පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය,"**වගේගොඩ, ඓතිහාසික රන්කොත්මළු පුරාණ රාජමහා විහාර පූජාභූමිය**" යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය.

2020 පෙබරවාරි මස 26 වැනි දින,
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

වගේගොඩ, ඓතිහාසික රන්කොත්මළු පුරාණ රාජමහා විහාර පූජාභූමිය සංයුක්ත වන ප්‍රදේශය

සර්වේ ජනරාල්ගේ 2019 අප්‍රේල් මස 09 වැනි දින සහ අංක H/TNG/2018/279 දරන අනුරේඛනයේ නිරූපිත දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නලගම (අ.ග.පි. 290) හා වල්ගන්එලිය (අ.ග.පි. 316) ග්‍රාමවල පිහිටි හෙක්ටයාර් 19.9379 ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

**කැබලි අංක A**

| | | |
|---|---|---|
| උතුරට | : | අගපි 316 හි කැබලි අංක 240, 239, 238, 225, 34 සහ මාර්ගය ; |
| නැගෙනහිරට | : | අගපි 316 හි කැබලි අංක 34 සහ 52 ; |
| දකුණට | : | අගපි 316 හි කැබලි අංක 34 සහ මාර්ගය (ප්‍රාදේශීය සභා) ; |
| බටහිරට | : | මාර්ගය (ප්‍රාදේශීය සභා), අගපි 316 හි කැබලි අංක 240, 239, 238 සහ 225. |

**කැබලි අංක E**

| | | |
|---|---|---|
| උතුරට | : | බස්නා ඇළ, අගපි 290 හි කැබලි අංක 250, 758, 816, 262, 263 සහ අගපි 316 හි කැබලි අංක 34 ; |
| නැගෙනහිරට | : | මාර්ගය (ප්‍රාදේශීය සභා) අගපි 316 හි කැබලි අංක 159 ; |
| දකුණට | : | මාර්ගය, අගපි 290 හි කැබලි අංක 747, 266, $268^{B}$ සහ 817 ; |
| බටහිරට | : | කෙත් ඇළ සහ බස්නා ඇළ. |

**කැබලි අංක F**

| | | |
|---|---|---|
| උතුරට | : | බස්නා ඇළ, අගපි 290 හි කැබලි අංක 250 සහ 262 ; |
| නැගෙනහිරට | : | මාර්ගය ; |
| දකුණට | : | අගපි 290හි කැබලි අංක 262, 758 සහ 757 ; |
| බටහිරට | : | බස්නා ඇළ. |

02 - 480

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.